**ශීර්ෂය 110 - අධිකරණ අමාත්‍යාංශය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 110 - අධිකරණ අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුලි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අධිකරණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරබවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.90,754,976 ක් වුව ද, දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය රු.90,752,784 ක් වූ අතර, ඒ අනුව රු.2,192 ක වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතුකර නොතිබුණි. | මෙම වෙනසට ප්‍රධාන වශයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් වැටුප් ලබන නිලධාරීන්ගේ ණයශේෂයන්වල වෙනස්කම් කිහිපයක් හේතු වී ඇති බවත්,අත්තිකාරම් බී ගිණුමේ ඇමුණුම 6.1 පරිදි අයකරගත යුතු රු.4,184 ක මුදල මේ වන විට අයකරගෙන ඇති අතර, ඉතිරි රු.1,992 ක කේවල ණය ශේෂවල පවතින වැඩිවීම නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු ය. |

(ආ) විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත්කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 110-1-2 -27 -2001 (17), 110 -1 -2 -24-2509(13),110-1-3-1-2509(13), 110-1-5-16-2509(13),110-1-5-23-2509(13) යන වැය විෂයයන් 05ක් යටතේ විදේශ ව්‍යාපෘති 05ක් වෙනුවෙන් දරන ලද රු.118,986,364 ක වියදම් සනාථ කිරීමට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම වටිනාකම්වල නිවැරදිතාවය විගණනයේදී තහවුරුකරගත නොහැකි විය. | 2024 මාර්තු 22 දින විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ මුදල් අමාත්‍යාංශයේ දී පැවති වෙනත් රාජ්‍යයන්/විදේශ සංවර්ධන හවුල්කරුවන්/ විදේශීය ආයතන විසින් ශ්‍රී ලංකාවට සපයන ප්‍රදාන සහ තාක්ෂණික සහාය ලබාගැනීම සහ නිසි ලෙස ගිණුම්ගත කිරීම පිළිබඳ සාකච්ඡාවේදී ලබාදුන් උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා තිබුණි. | වියදම් සනාථ කිරීමට සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතු ය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලධන වැය විෂයයන් 37 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 43ක් සඳහා ප්‍රතිපාදිත එකතුව රු.2,482,370,160 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 1,034,228,990 ක ඉතිරිවීම් පැවතුණු අතර, එම ඉතිරිවීම් ශුද්ධ | "රාජ්‍ය වියදම් පාලනය" සම්බන්ධයෙන් අයවැය චක්‍රලේඛ 03/2022 ප්‍රකාරව වියදම් පාලනය කිරීමට කටයුතු කළ බව දන්වා තිබූ අතර පැවති අයහපත් ආර්ථික තත්ත්වය යටතේ අපේක්ෂිත පරිදි ව්‍යාපෘති කාර්යක්ෂමතාවය ළඟාකර ගැනීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | සකසුරුවම හා කාර්යක්ෂමතාවය පිළිබඳ අවධානය යොමු කරමින් නිසි සැලකිල්ලෙන් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපාදනයෙන් සියයට 17 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි. | | යුතු ය. |
| (ආ) | පර්යේෂණ හා සංවර්ධන වෙනත් වියදම් වැය විෂයයට රු.1,000,000 ක් ප්‍රතිපාදනයකර තිබූ අතර, ඉන් වර්ෂය තුළ කාර්යසාධන වාර්තා මුද්‍රණය කිරීම සඳහා පමණක් රු. 596 ක වියදමක් දරා තිබුණි. | බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ පිටපත් 25 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් සියයට 3 ක හිඟ VAT මුදල 2023 වර්ෂයේදී 110-01-07-0-2509 වැය විෂයය මගින් ගෙවීම් කරන ලද බවත්, කාර්යසාධන වාර්තාවේ මුද්‍රණ කටයුතු සඳහා වියදම් මෙම වැය විෂයය යටතේ ඇස්තමේන්තුකර ඇති බැවින් එම වැය විෂයය මගින් වියදම සිදුකර ඇති බවත් දන්වා තිබුණි. | සකසුරුවම හා කාර්යක්ෂමතාවය පිළිබඳ අවධානය යොමු කරමින් නිසි සැලකිල්ලෙන් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය. |
| (ඇ) | එක් එක් ව්‍යාපෘති හා උප ව්‍යාපෘතිවල වෙනත් වැය විෂයයන් 10 ක එකතුව රු.103,579,353 ක ඉතිරිවීම් සියයට 17 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණ ද, 2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 5/2023 ප්‍රකාරව එම ඉතිරිවීම්වලට හේතු ඉදිරිපත්කර නොතිබුණි. | 2023 වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීමේ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2023 හා එහි ආකෘතීන් අනුව එක් එක් වැය විෂයය සංකේතාංකයේ සමස්ථ ඉතිරිය ඉදිරිපත් කරනු ලබයි. එහිදී අධිකරණ වැය ශීර්ෂයෙහි (110) මෙහෙයුම් ක්‍රියාකාරකම් වැඩසටහනට (1) අදාළ ව්‍යාපෘතීන් (1සිට 7 දක්වා) යටතේ එක් එක් වැය විෂයය සංකේතාංකය අනුව විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඈ) | වැය විෂයයන් 4 කට අදාළව රු.85,000,000 ක් වූ ඇස්තමේන්තු ප්‍රතිපාදනයට මුදල් රෙගුලාසි 66 මගින් එකතුව රු.12,375,100 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණ ද, එම මාරු කරන ලද ප්‍රතිපාදන උපයෝජනයකර නොතිබුණි. | වර්ෂය අවසානයේදී මුදල් රෙගුලාසි 66 මගින් ප්‍රතිපාදන මාරුකිරීම සඳහා අනුමැතිය ලැබීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම හේතුවෙන් මුදල් රෙගුලාසි යටතේ මාරු කළ ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | සකසුරුවම හා කාර්යක්ෂමතාවය පිළිබඳ අවධානය යොමු කරමින් නිසි සැලකිල්ලෙන් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ගිණුම් ප්‍රකාශයෙහි ඇමුණුම (iv) හි සඳහන් රු.3,801,149 ක් වූ බැරකම් භාණ්ඩාගාර මුද්‍රිත SA 92 ප්‍රකාශයට ඇතුළත්කර නොතිබුණි. | 2023 වර්ෂයට අදාළ බැරකම් නිවැරදිව බැරකම් ලේඛනයේ සටහන්කර ඇති නමුත් CIGAS Web Interface වෙත උඩුගත (Upload) කර නොමැති බැවින්, භාණ්ඩාගාර මුද්‍රිත SA92 ප්‍රකාශයට ඇතුළත් වී නොමැත. ඉදිරියේදී බැරකම් නිවැරදි කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දුන් බව දන්වා තිබුණි. | බැරකම් සිගාස් වැඩසටහන මගින් භාණ්ඩාගාරයට වාර්තා කළ යුතු ය. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 215 | 1,376,318 | මුදල් රෙගුලාසිවලට පටහැනිව මෝටර් රථයක් අලුත්වැඩියාව සඳහා සියයට 50ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. | එම කාලවකවානුව තුළ රට තුළ පැවති අයහපත් ආර්ථික තත්ත්වය හමුවේ විදේශ විනිමය සීමා වීම, විදේශ විනිමය අනුපාතවල පැවති උච්ඡාවචනයන්, වාහන අමතර කොටස්වල මිල ගණන් දිනෙන් දින ඉහළ යෑම, වාහන අලුත්වැඩියා කරන ආයතනවල පැවති මූල්‍ය දුෂ්කරතා වැනි කරුණු මත රථය අලුත්වැඩියා කිරීමට ආයතනයක් සොයා ගැනීමේ ප්‍රායෝගික දුෂ්කරතාවය, රථය අලුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවය යන කරුණු සලකා අත්තිකාරම් මුදල් ගෙවීම සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලැබී ඇති බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | 1645 | ලොරි රථයට 2023 ජනවාරි 30 හා 2023 පෙබරවාරි 15 දින ලබාගත් ඉන්ධන මුදල් රෙගුලාසි පරිදි දෛනික ධාවන සටහන් පත්‍රයේ සටහන් කර යාවත්කාලීන කර නොතිබුණි. | මෙම කරුණ සම්බන්ධයෙන් පරික්ෂණයක් සිදු කෙරෙමින් පවතින බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ii) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | නිල වාහන සඳහා වූ මාසික දෛනික සටහනෙහි රියදුරන් විසින් වාහන අංකය, මාසය,මාසය ආරම්භක හා අවසාන දින මයිලෝ මීටරයේ අංක හා ධාවනය වූ කි.මී ගණන සටහන්කර නොතිබුණි. | නිලධාරින් සඳහා අනුයුක්ත කරන ලද වාහනවල, මාසික දෛනික සටහනෙහි අඩංගු විය යුතු වාහන අංකය, මාසය, මාසය ආරම්භක දිනයේ මීටරයේ අංකය, මාසයේ අවසාන දිනයේ මීටරයේ අංකය හා ධාවනය වූ කි.මී ගණන ආදි විස්තර සටහන් කරන ලෙස එම වාහනවල රියදුරන්ට දැනුවත්කර ඇති බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | 2018 ජනවාරි 24 දිනැති අංක 5/2018 (I) චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 5/2008 දරන චක්‍රලේඛය | පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කිරීමට කටයුතු සිදු කරමින් පවතී. එය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන අතර ඉදිරියේදී එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය නිමකර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුව ද, අවස්ථා 36 කදී ලබාදුන් රු.1,304,327 ක් වටිනා අතුරු අග්‍රිම එසේ නියමිත දින පියවා නොතිබුණි. | තත්කාර්යය අතුරු අග්‍රිම ඉල්ලීම් සඳහා නව ආකෘතිපත්‍රයක් හඳුන්වාදී ඇති අතර, එමඟින් නිලධාරීන් මු.රෙ.371 අනුව ක්‍රියාකිරීමට බැඳී ඇති බැවින් ඉදිරියේදී මෙම තත්ත්වය පාලනය වනු ඇතැයි අපේක්ෂා කරන බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | 2023 පෙබරවාරි 24 දින නිලධාරියෙකු විසින් වීන ව්‍යාපෘතිය වෙනුවෙන් වූ ඉඩමකට විදුලිය සැපයුම ලබාගැනීම වෙනුවෙන් රු.7,500 ක අත්තිකාරම් මුදලක් ලබාගෙන කිසිදු මුදලක් වැය කිරීමකින් තොරව දින 22 කට පසුව පියවා තිබුණි. | රාජ්‍ය ආයතනයකට ලබා ගන්නා විදුලි සැපයුමක් නිසා එම මුදල ලංකා විදුලි බල මණ්ඩලය විසින් අය නොකරන ලදී. එබැවින්, එම ලබාගත් අත්තිකාරම් මුදල සම්පූර්ණයෙන් පියවීමට කටයුතුකර ඇති බව දන්වා තිබුණි. | අත්තිකාරම් ලබාදීමේ දී අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගත යුතු ය. |
| (ඇ) | නිලධාරීන් 06 දෙනෙකු වෙත අවස්ථා 07 කදී නිකුත්කර තිබූ එකතුව රු.228,830 ක් වූ ඉන්ධන අත්තිකාරම් මාස 01 සිට මාස 03 දක්වා කාලපමාවකින් පසු පියවා තිබුණි. | මේ වන විට ලබාගත් ඉන්ධන අත්තිකාරම් කාර්යය නිම වී දින 10 ක් ඇතුළත පියවන බව දන්වා තිබුණි. | ලබාගත් අත්තිකාරම් කාර්යය නිමකළ වහාම පියවිය යුතු ය. |
| (ඈ) | අවස්ථා 02 කදී ලබාගත් රු.11,640 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිමය නොපියවා රු.45,887 ක අත්තිකාරම් නැවත ලබාගෙන තිබුණි. | අතපසුවීමකින් මෙම නිලධාරීන්ට ලබාගත් අත්තිකාරම් මුදල පියවීමට පෙර නැවත අත්තිකාරම් මුදල් ගෙවීම් සිදුකර ඇත. ඉදිරියේදී මෙවැනි අතපසුවීම් සිදු නොවන පරිදි කටයුතු කරන ලෙසට අදාළ නිලධාරීන් දැනුවත් කළ බව දන්වා තිබුණි. | ලබාගත් අත්තිකාරම් කාර්යය නිම කළ වහාම පියවිය යුතු ය. |

**2.4 බැංකු ගිණුම් මෙහෙයවීම**

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | චෙක්පත් භාරගැනීමේ ලේඛනයට අනුව වටිනාකම රු.144,153 ක් වූ ගෙවීම්වලට අදාළ චෙක්පත් හතරක් අදාළ ආයතනය/පුද්ගලයන් විසින් භාරගත් බවට අත්සන්කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අතපසුවීම් සිදු නොවන බවට වගබලා ගන්නා ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව දන්වා තිබුණි. | චෙක්පත් භාරගත් බවට අත්සන්කර තිබිය යුතු ය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද මාස 06 ඉක්ම වූ චෙක්පත්වල වටිනාකම රු.185,536 ක් වුව ද, මූල්‍ය ප්‍රකාශනයේ 2023 දෙසැම්බර් 31 දිනට වූ බැංකු ගිණුම් පිළිබඳව තත්ත්ව වාර්තාව (ඇමුණුම viii) හි එය රු.233,459 ක් ලෙස දක්වා තිබුණි. | මෙවැනි අතපසුවීම් සිදු නොවීමට ඉදිරියේදී කටයුතු කරන ලෙසට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු ය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | Efficient and Effective Justice වෙනුවෙන් වැය විෂය අංක 110-1-2-28-2509 (13) යටතේ රු.මිලියන 150 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. නමුත් මෙම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 70 ක් Supporting Effective Dispute Resolution – SEDR වැඩසටහනට මාරුකර තිබුණි. | 110-1-3-1-2509/13 (Supporting Effective Dispute Resolution - SEDR) විදේශ ප්‍රධාන ව්‍යාපෘතිය වෙත 2023 වර්ෂයේ අයවැය මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම නිසා 110-1-2-28-2509(13) (Efficient and Effective Justice) වැය විෂයෙහි ප්‍රතිපාදන රෙගුලාසි 66 ප්‍රකාරව මාරු කළ බව දන්වා තිබුණි. | සැලසුම් කළ පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය. |
| (ආ) | පුනරුත්ථාපනය අරමුණු කරගත් ආර්ථික සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය (110-1-5-19-2509) සඳහා රුපියල් මිලියන 15 ක ප්‍රතිපාදන සලසාගෙන තිබූ අතර, ඉන් මිලියන 10.96 ක් ම ව්‍යාපෘතිය ආරම්භ කළ අවස්ථාවේ සිටම යොදවා තිබුණේ | 110-1-5-19-2509 යටතේ ක්‍රියාකාරී සැලැස්ම අනුව පුනරුත්ථාපනය අරමුණු කරගත් ආර්ථික සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය (REEP) වෙනුවෙන් 2023 වර්ෂයේදී රුපියල් මිලියන 15 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද, | අවශ්‍යතාවයන් හඳුනාගෙන සැලසුම් කිරීම හා සැලසුම්කළ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| ආන්තිකරණයට ලක් වූ කාන්තා පාලන පවුල් ආර්ථික සවිබල ගැන්වීමේ ව්‍යාපෘති (උතුරු, නැගෙනහිර) සඳහායි. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්මට අනුව හා ප්‍රතිපාදන සලසාගෙන තිබුණු පරිදි පුනරුත්ථාපනය වූවන් වෙනුවෙන් ප්‍රතිපාදන යොදවා නොතිබුණි. | මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිව සිට පුනරුත්ථාපනය වූ තරුණ තරුණියන් සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ව්‍යාපෘති යෝජනා ප්‍රමාණවත් පරිදි ඉදිරිපත් නොවී ය. කෙසේ වුව ද ඉදිරියේදී ව්‍යාපෘති යෝජනා සැලකිල්ලට ගෙන ඇස්තමේන්තු සකස් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි. | |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමථ මණ්ඩල කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්මට අනුව 2023 තුන්වන කාර්තුව වන විට විශේෂ සමථ මණ්ඩල 07 ක් සඳහා සමථකරුවන්ට පත්වීම් ලබාදීමට සැලසුම්කර තිබුණ ද, 2023 වර්ෂයේ කිසිදු පත්කිරීමක් සිදුකර නොතිබුණු අතර, සම්මුඛ පරීක්ෂණ 06 ක් පමණක් වර්ෂය තුළ සිදුකර තිබුණි. | සැලසුම් කළ පරිදි පළමුවන හා දෙවන කාර්තුවලදී සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නොහැකි වූ අතර, වර්ෂය අවසන්වීමට ප්‍රථම සැලසුම් කළ සම්මුඛ පරීක්ෂණ 07 න් 06 ක් පමණක් පවත්වා පුහුණුව සඳහා නිලධාරීන් තෝරා තිබුණ ද, ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිවීම මත පුහුණු වැඩසටහන් පවත්වා අදාළ පත්වීම් ලබාදීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | සැලසුම් කළ කාර්යයන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | මූල්‍ය සමථ මණ්ඩල 06 පිහිටුවීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම 2023 දෙවන කාර්තුවේ සිට සිදුකළ යුතු වුවත්, මූල්‍ය සමථ මණ්ඩල 06 ක් සඳහා ගැසට් නිවේදනයක් පළ කිරීම පමණක් 2023 තුන්වන කාර්තුව තුළ සිදුකර තිබුණි. ක්‍රියාකාරී සැලැස්මට අනුව ගැසට් නිවේදන පළ කිරීම 2023 වර්ෂයේ පළමු කාර්තුව තුළ සිදුකළ යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකිරීමෙන් සැලැසුම් කළ පරිදි මූල්‍ය සමථ මණ්ඩල පිහිටුවීමට නොහැකි වී තිබුණි. | මූල්‍ය සමථ මූල මණ්ඩල 06 ක් 2023 වසර තුළදී ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණ ද, ගැසට්පත්‍රයේ සිදුකළ යුතු සංශෝධන සිදු කිරීම හේතුවෙන් සමථ මූල මණ්ඩල පිහිටුවීමේ කටයුතු ප්‍රමාද වූ අතර, මේ වන විට මූල්‍ය සමථ මූල මණ්ඩලවල සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා හා පස්දින පුහුණුව පැවැත්වීම සඳහා SEDR ව්‍යාපෘතිය යටතේ විදේශ ප්‍රදානයන් හිමිව ඇති අතර මොණරාගල, අනුරාධපුර, පොළොන්නරුව, ගම්පහ, මහනුවර හා කොළඹ සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන්ව ඇත. මෙම මූල්‍ය සමථ මූල මණ්ඩල සඳහා ජූනි හා ජූලි මාසවලදී පස්දින පුහුණු පැවැත්වීමට සැලසුම් කර ඇති බව දන්වා තිබුණි. | නිසි අධ්‍යනයකින් පසු සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය. |

## 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යාපනය දිස්ත්‍රික්කයේ වැසි ජලයෙන් වගා කටයුතු සිදු කිරීමේ පද්ධති 3000 ක් ඉදිකිරීම සඳහා වූ රු. මිලියන 100 ක ඉන්දියානු රජයේ ප්‍රදානය හා රු.මිලියන 20 ක විදේශ ප්‍රධාන මූල්‍යකරණය සඳහා වූ ප්‍රතිපාදනය, ව්‍යාපෘතියේ කාලය දීර්සකර නොගැනීම නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමෙන් සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | අදාළ අවබෝධතා ගිවිසුමේ කාලය දීර්ඝ කිරීම සඳහා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය එකඟතාවය පළකර ඇති අතර, ඊට අදාළ කෙටුම්පත් ලිපිය විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා මෙම අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. අදාළ කටයුතු නිශ්චය කිරීමෙන් පසු කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගත යුතු අතර, එම අනුමැතිය ලැබුණු පසු ගිවිසුම අත්සන්කර ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු නිම කිරීමට අපේක්ෂිත බව දන්වා තිබුණි. | සැලසුම් කළ කාර්යයන් නිසි පරිදි නිම කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | යුක්තිය පසිදලීම පිළිබඳ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම වැය විෂයය අංක 110-1-2-8-2509 යටතේ ප්‍රතිපාදන රු.5,000,000 ක් වුව ද, එහි වියදම රු.78,158 ක් විය. මෙම වියදම තුළ තාවකාලික රියදුරන් 03 දෙනෙකු වෙනුවෙන් ගෙවූ අතිකාල දීමනා හා දෛනික වැටුප් වියදම් රු.49,781 ක් වූ අතර, රු.22,598 ක භාෂා පරිවර්ථන දීමනාවක් ද විය. මේ අනුව යුක්තිය පසිදලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මකකර නොතිබුණි. | 110-01-02-08-2509 වැය විෂයය යටතේ යුක්තිය පසඳලීම පිළිබඳ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා වූ ව්‍යාපෘතිය යටතේ දරනු ලබන වියදම් ගිණුම්ගත කරනු ලබයි. එම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ ක්‍රියාත්මක නොකළ ද 2022 වර්ෂයේ එම ව්‍යාපෘතියට අදාළ වියදම් එම ව්‍යාපෘතිය වෙනුවෙන් වූ 110-01-02-08-2509 වැය විෂයයට හර කරන ලද අතර, 2023 වර්ෂයේදී ද ඒ අනුව එම ව්‍යාපෘතියට අදාළ වියදම් මෙම වැය විෂයයට හරකර ඇති බව දක්වා තිබුණි. | සැලසුම් කළ කාර්යයන් නිසි පරිදි නිම කිරීමට කටයුතු කළ යුතු ය. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයය අංක 110-1-2-29- 2509 (17) යටතේ ළමුන් සඳහා නීති ආධාර සැපයීම සම්බන්ධව වත්මන් තත්ත්වය, ධාරිතා වර්ධනය සහ සෘජු මැදිහත්වීම තක්සේරු කිරීම මගින් නීති ආධාර සේවා පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අදාළව විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. නමුත් | මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක කරන ලද වැඩමුළුව 2023 ඔක්තෝබර් මාසයේදී පැවැත් වූ අතර, එම වැඩමුළුවේදී ඉදිරිපත් වූ නිර්දේශ අතුරින් හඳුනාගත් ප්‍රමුඛ අවශ්‍යතා ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව පළාත් මට්ටමේ වැඩසටහන් පැවැත්වීමට තීරණය කරන ලද බව දන්වා තිබුණි. | සැලසුම් කළ කාර්යයන් සැලසුම් කළ කාලවකවානු තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය. |

2023 ඔක්තෝබර් මස බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත් වූ මෙම ව්‍යාපෘතියට අදාළ ආරම්භක වැඩසටහන සඳහා වැය විෂයය අංක 110 – 1 – 2 – 29 – 2509 (13) යටතේ වූ රු.15,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.560,046 ක වියදම් දරා තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය වර්ෂය තුළ ක්‍රියාත්මකකර නොමැති බව නිරීක්ෂණය විය.

## 3.5 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන අත්පොතෙහි 2.14.1 ප්‍රකාරව අවම වශයෙන් සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන්වත් මිල ගණන් කැඳවා සුදුසු සැපයුම්කරුවෙකු තෝරාගත යුතු වුවත්, ඊට පටහැනිව දුරකථන නාමාවලියෙහි සඳහන් එක් ආයතනයකින් පමණක් මිල ගණන් කැඳවා වාහන අලුත්වැඩියාව සිදුකර තිබුණි. | පළමුව ඒජන්ත ආයතනයෙන් හා පසුව ආයතන 07 කින් තරඟකාරී මිල කැඳවීම්කර ඇත. එමෙන්ම වාහන අමතර කොටස් ආනයනය සීමා කරමින් රටේ පැවති තත්ත්වය මත ඇති වී තිබූ ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් අමතර කොටස් ලබා ගැනීමේ අපහසුව මත යාන්ත්‍රික අධිකාරීගේ නිර්දේශය සලකා තනි ඇස්තමේන්තුවක් ලබාගෙන ඇත්තේ තරගකාරී මිල කැඳවීම අසාර්ථක වූ බැවින් බව දන්වා තිබුණි. | ප්‍රසම්පාදන අත්පොතෙහි යොමුගත වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 3.6 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකරණ අමාත්‍යාංශය විසින් භුක්ති විඳින නුවරඑළිය සංචාරක බංගලාව පිහිටි හෙක්ටයාර් 0.2023 ක් වූ ඉඩම, රක්වාන සංචාරක බංගලාව පිහිටි රූඩ් 01 පර්චස් 10 ක් වූ ඉඩම, බත්තරමුල්ල ළමා මහේස්ත්‍රාත් අධිකරණය පිහිටි හෙක්ටයාර් 0.1760ක් වූ ඉඩම හා අධිකරණ පියස ඉදිකරන සමාගමකට අයත් හෙක්ටයාර් 2.4281 (අක්කර 06) ඉඩම් පවරාගැනීමේ කටයුතු අවසන්කර නොතිබූ අතර, වටිනාකම් තක්සේරු කරගෙන ද නොතිබුණි. | නුවරඑළිය සංචාරක බංගලාව පිහිටි ඉඩම අමාත්‍යාංශය වෙත පවරාදීමට ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ද, රක්වාන සංචාරක බංගලාව පිහිටි ඉඩම පවරාගැනීමට මැනුම් කටයුතු සඳහා මිනින්දෝරු අධිකාරීවරයා වෙත ද, බත්තරමුල්ල ළමා මහේස්ත්‍රාත් අධිකරණය පිහිටි ඉඩම විධිමත්ව පවරාදීම සඳහා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් වෙත ද, දන්වා තිබුණි.<br>අධිකරණ පියස ඉදි කරන BCC ලංකා සමාගමට අයත් ඉඩම අත්කර ගැනීම වෙනුවෙන් වන්දි මුදලක් තීරණය වී ඇති | ඉඩම් කඩිනමින් පවරා ගෙන තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු ය. |

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| | අතර, පවරාදීමේ කාලරාමුව සම්බන්ධයෙන් ඉදිරියේදී දැනුම් දෙන බව ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම්දී ඇති බව දන්වා තිබුණි. | |

**3.7 රජයේ නිලධාරීන් ඇප තැබීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත හා අධිකරණ අමාත්‍යාංශයේ 2011 ජනවාරි 18 දිනැති 01/2011 චක්‍රලේඛය අනුව ඇප තැබිය යුතු නිලධාරීන් 10 දෙනෙකු 2023 දෙසැම්බර් 31 වන විට ඇප තබා නොතිබුණි. | මෙම නිලධාරීන්ට අදාළව ඇප තැබීමේ කටයුතු සිදු කරන අතර, මේ වනවිට නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කර ඇති බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**3.8 කළමනාකරණ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමථ මූල මණ්ඩලයක ධූර කාලය අවසන් වූ පසු සමථ මූල මණ්ඩල පත්කිරීමට වසර 04 කට ආසන්න කාලයක් ගත වී තිබුණි. බොහෝ සමථ මූල මණ්ඩල සාමාජිකයින්ගේ ධූර කාලය අවසන් වුව ද, නව පත්වීම් සඳහා දැන්වීම් පළ කිරීම (ගැසට් නිවේදන) ප්‍රමාදවීමෙන් සාමාජිකයන් පත් කිරීම දක්වා වූ කාර්යයන් සිදු කිරීමට ප්‍රමාද වී තිබුණි.කරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව සමථ මණ්ඩලවල ධූර කාලය අවසන් වී තිබුණ ද, විගණන දිනය වන 2024 පෙබරවාරි 06 දින වන විට ද පත් කිරීම් සිදුකර නොතිබුණු අවස්ථා 45 නිරීක්ෂණය විය. | පත්වීම් ලබාදීමේදී සිදුවන ප්‍රමාදයන් මගහරවා ගැනීමට මේ වන විට සමථ මූල මණ්ඩලවල ධූර කාලය අවසන් වීමට පෙර ගැසට් නිවේදනය සඳහා යොමු කිරීම සිදු කරමින් පවතින අතර, එය ධූර කාලය අවසන් වන දින සිට මාස 06 කට පෙර සිදු කරන බව දන්වා තිබුණි. | ධූර කාලය අවසන් වීමෙන් පසු කඩිනමින් පත්වීම් කළ යුතු ය. |
| (ආ) | සමථ මණ්ඩල සාමාජිකයන්ට රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් ගෙවනු ලබන රු.25,000 ක මාසික දීමනාව ගෙවීමේදී ඇතැම් සාමාජිකයන් සියලුම රැස්වීම්වලට සහභාගී වී තිබූ අතර, සමහර සාමාජිකයින් එක් රැස්වීම් | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1281/II හා 2016 අගෝස්තු 11 හා 2016 ඔක්තෝබර් 05 දිනැති ලිපි අනුව සමථ මණ්ඩල කොමිෂන් සභාවේ සභාපති ඇතුළු කොමසාරිස්වරුන්ට දීමනා ගෙවනු ලබන | සියලුම සාමාජිකයන්ගේ උපරිම දායකත්වය ලබාගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | වාරයකට පමණක් සහභාගී වී තිබුණි. එසේ වුව ද, සහභාගීත්වය නොසලකා මාසික දීමනාව සියලුම සාමාජිකයින්ට ගෙවා තිබීම හේතුවෙන් රැස්වීම් සඳහා සියලුම සාමාජිකයින්ගේ උපරිම දායකත්වය ලබාගැනීමට නොහැකි වී තිබුණි. | අතර ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ද උපදෙස් විමසා සුදුසු පරිදි දීමනා ගෙවීම් කිරීමට කටයුතු කිරීමට නියමිත බව දන්වා තිබුණි. | |
| (ඇ) | වැඩ තහනම් කළ නිලධාරීන් 05 දෙනෙකුගෙන් හා සේවයහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.790,912 ක් වූ ණයශේෂ වසර 05 කට වැඩි කාලයක සිට අය නොවී පැවතිණි. | වැඩ තහනමට ලක්වූ නිලධාරීන් 05 දෙනාගේ රු.552,516 ක ණයශේෂ පවතින අතර, පී.වී. ගුණවර්ධන මහතාගේ - රු.162,215 ක ණය සඳහා කොළඹ මහාධිකරණයේ නඩු පවරා ඇති බව ද, ජී.ජ්.සී.ගමආරච්චි මහතාගේ රු.111,832 ක ණය සඳහා ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව ද, එම්.අයි.ප්‍රනාන්දු මහතාගේ රු.49,150 ක ණය අයකර ගැනීම සඳහා කෙසෙල්වත්ත පොලිසියේ පැමිණිල්ලක් ගොනුකර ඇති බව ද, ඒ.එන්.ඒ.සමරනායක මහතාගේ රු.110,855 ක ණය හා ජේ.එම්.එස්.කුමාරසිරි මහතාගේ රු.118,465 ක ණය මුදල් සඳහා පිළිවෙලින් කොළඹ හා ගංගොඩවිල දිසා අධිකරණවල නඩුවක් පවතින බව ද දන්වා තිබුණි.සේවය හැර ගිය නිලධාරීන් 02 දෙනාගේ රු.238,395 ක ණයශේෂය යටතේ එච්.එස්.සී. පුෂ්ප කුමාර මහතාගේ රු.121,392 ක ණය සහ එච්.ඒ.ඒ. චාමර මහතාගේ රු. 117,003 ක ණය සඳහා නීතිමය පියවර ගැනීමට අදාළ තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති බව දන්වා තිබුණි. | ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඈ) | මිල ගණන් කැඳවා වාහන අලුත්වැඩියා කටයුතු සිදු කිරීමේදී 2023 වර්ෂයේ ලියාපදිංචි කරන ලද සැපයුම්කාර ආයතනවලින් පරිබාහිරව ජුනි මාසයේදී අවස්ථා දෙකකදී අලුත්වැඩියා කටයුතු සිදු කරගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | මෙම අමාත්‍යාංශයේ වාහන අලුත්වැඩියා හා සේවා කිරීම සඳහා 2023 ජුලි 05 දින සිට ගරාජයන් ලියාපදිංචිකර ඇති අතර, 2022 වර්ෂයේ ලියාපදිංචි ගරාජයන් මඟින් ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතිය මත අලුත්වැඩියා කටයුතු සිදුකර ඇති බව දන්වා තිබුණි. | ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනය යාවත්කාලීනව පවත්වාගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2022 දෙසැම්බර් 30 දිනැති වටිනාකම රු.976,250 ක් වූ චෙක්පත් දෙකක් දින 12 ක් රඳවාගෙන 2023 ජනවාරි 13 දින පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබුණි. නැවත මෙම චෙක්පත් අවලංගු කර 2023 ජනවාරි 24 දින නව චෙක්පත් නිකුත්කර තිබුණි. | 69-1017 හා KM-4565 අංක දරන වාහන අලුත්වැඩියාවන් සඳහා පිළිවෙලින් රු.577,550 හා රු.398,700 ක මුදලක් ඇස්තමේන්තු කර ඇති අතර යාන්ත්‍රික මෝටර් රථ අධිකාරීවරයා විසින් මුල් ඇස්තමේන්තුවෙන් රු.25,000 ක් අඩු කර නිර්දේශ ලබාදී ඇත. නමුත්, වවුචර්පත් පිළියෙල කිරීමේදී අතපසුවීමකින් රු.25,000 ක මුදල අඩු නොකර මුල් ඇස්තමේන්තුවට සකසා ඇත. පසුව එම චෙක්පත් පොදු තැන්පත් ගිණුමට මාරුකර රු.25,000ක මුදලක් රජයේ ආදායමට බැරකර ඉතිරි මුදල අදාළ ආයතන වෙත ගෙවීම් කළ බවත්, මින් ඉදිරියේ දී මෙවැනි අතපසුවීම් සිදු නොවීමට අදාළ උපදෙස් නිලධාරීන්ට ලබාදුන් බවත් දන්වා තිබුණි. | ගෙවිය යුතු වටිනාකම තහවුරුකර ගෙන ගෙවීම් කළ යුතු ය. |
| (ඊ) | මහා භාරකාර දෙපාර්තමේන්තුව, ධීවර අමාත්‍යාංශය හා අධිකරණ අමාත්‍යාංශ යටතේ පවතින ආයතන 4 ක් ද, ඇතුළත්ව ආයතන 6 ක් සඳහා වාහන 12 ක් ලබාදී තිබූ අතර, ඒවා නැවත පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි. | මහාභාරකාර දෙපාර්තමේන්තුව සහ ධීවර අමාත්‍යාංශය වෙත ලබාදී ඇති වාහන නැවත ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත්, නඩුගොනු ප්‍රවාහන කටයුතු අවසන් වූ පසු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ලබාදී ඇති වාහනය ලබාදීමට කටයුතු කරන බවත්,සමථ මණ්ඩල කොමිෂන් සභාව වෙත ලබාදී ඇති වාහනයේ අලුත්වැඩියා හා අනෙකුත් කටයුතු අධිකරණ අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන බවත්, ණය සහනදායී මණ්ඩලීය දෙපාර්තමේන්තුව, ජාතික සමඟිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය සහ නීති ආධාර කොමිෂන් සභාව වෙත ලබාදී ඇති වාහන පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් දන්වා තිබුණි. | වාහන නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (උ) | දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවා ඇති විශේෂ (ඉඩම්) සමථ මණ්ඩල 16 ක් පැවතිය ද මන්නාරම, වව්නියාව, යාපනය, අනුරාධපුර, ත්‍රිකුණාමලය, මඩකළපුව විශේෂ සමථ මණ්ඩල නැවත පත්කිරීම සිදුකර නොමැති අතර, ගාල්ල, මාතර, පුත්තලම,කෑගල්ල දිස්ත්‍රික්කවල විශේෂ සමථ මණ්ඩල පිහිටුවා නොතිබුණි. | විශේෂ සමථ මූල මණ්ඩල (ඉඩම්)නැවත පත්කිරීම් නොකළ ද, නිලධාරීන්ගේ රාජකාරී ලැයිස්තුවට අනුව ඉටුකළ යුතු රාජකාරී බොහොමයක් පවතින බව දන්වා තිබුණි. | සමථ මණ්ඩල පිහිටුවීම හා සාමාජිකයින් පත් කිරීම් කඩිනමින් කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඟ) | ත්‍රිකුණාමලය මහේස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද කැබ් රථයක් 2010 වර්ෂයේදී අධිකරණ අමාත්‍යාංශයේ භාවිතය සඳහා ලබාදී තිබූ අතර, එය 2018 වර්ෂයේදී අනතුරකට ලක්වීම සම්බන්ධයෙන් වූ අවසන් පරීක්ෂණ වාර්තාව හා 2021 මැයි 12 දිනැති අතුරු වාර්තාව අනුව වසර 05කට පසු මෙම රථය අලුත්වැඩියා කිරීමට තීරණය වී තිබුණි. නමුත් 2023 මැයි 03 මෝටර් රථ දෙපාර්තමේන්තු ලිපියට අනුව මෙම වාහනයේ චැසි අංක හා එන්ජින් අංක මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත හා නොගැලපීම හේතුවෙන් අමාත්‍යාංශයට පවරා ගැනීම ගැටලු සහගත බැවින් අමාත්‍යාංශ භූමියේ වසර 06 ක පමණ කාලයක සිට ගාල් කර පැවතුණි. | රථය අපහරණය කිරීම සඳහා ක්‍රියා කිරීමේදි රථයේ චැසි අංකයට අදාළ දත්තයන් ගැලපීමක් සිදු නොවූ හේතුව මත ඒ පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයක් සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | තක්සේරු වාර්තාවක් ලබාගෙන කඩිනමින් සුදුසු කටයුතු කළ යුතු ය. |
| (ච) | වසර 05 කට අධික කාලයක් අබලන්ව පැවති ත්‍රීවීලර් රථයක් අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි. | QB – 2005 ත්‍රීවීලර් රථය අපහරණය කිරීම සඳහා තක්සේරු කමිටුව විසින් ලබාදී ඇති තක්සේරු වාර්තාව මේ වනවිට ලබාදී ඇති අතර, අපහරණයට අදාළ ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | අපහරණය කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඡ) | පනතක් මගින් වෙනම කාර්ය මණ්ඩලයක් සහිතව වෙනම ඒකකයක් ලෙස ක්‍රියාත්මක වන ආයතන 06 ක් අධිකරණ අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘතීන් ලෙස හඳුනා ගෙන එම ව්‍යාපෘතිවල වියදම් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්කර තිබුණ ද, එම ආයතනවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී ලෙස අමාත්‍යාංශ ලේකම් එම ආයතනය සඳහා ප්‍රතිපාදිත මුදල් වැය කිරීමේ කාර්යක්ෂමතාවය පිළිබඳ අධීක්ෂණයක් සිදු කරන්නේ ද යන්න පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | 2022 ජුලි මස 22 දිනැති අංක 2289/43 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් ජනාධිපතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව අමාත්‍යවරුන්ට විෂයයන් හා කාර්යභාරයන් වෙන් කිරීමේදී මෙම ආයතන අධිකරණ අමාත්‍යවරයාගේ විෂයය පථය යටතට ඇතුළත්කර ඇති බව දන්වා තිබුණි. | මෙම වැඩසටහන්වල කාර්යක්ෂමතාවය පිළිබඳව අධීක්ෂණයක් සිදුකළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන අංශය විසින් ක්‍රියාත්මකකර තිබූ ව්‍යාපෘතිවල ප්‍රගති වාර්තා ව්‍යාපෘතිය අවසන්කර දින 07 ක් ඇතුළත අදාළ විස්තර සමඟ අමාත්‍යාංශයට වෙත එවිය යුතු වුවත්, දිස්ත්‍රික්ක/ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒ අනුව කටයුතුකර නොමැති වීම නිසා ව්‍යාපෘතිවල සත්‍ය වියදම විගණනයට තහවුරු නොවුණි. | 2024 මැයි මස වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත නිලධාරීන්ගෙන් සියයට 85 ක් පමණ ව්‍යාපෘතිවල ප්‍රගති වාර්තා අදාළ විස්තර සමඟ අමාත්‍යාංශය වෙත ලබා දී ඇති අතර, නව තාක්ෂණය යොදා ගෙන වාර්තා කැඳවීමට ක්‍රමවේදයක් සලසා ගන්නා මෙන් නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. එමෙන්ම මින් ඉදිරියට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන වාර්තා සහ අවසන් ව්‍යාපෘති වාර්තා විගණනය වෙත නිසි පරිදි ලබාදීමට සටහන්කර ගත් බව දන්වා තිබුණි. | අදාළ වාර්තා නියමිත පරිදි ගෙන්වා ගත යුතු ය. |
| (ඕ) | චීන රජයේ ආධාර මත ප්‍රතිසංස්කරණය කෙරෙන ශ්‍රී ලංකා උපරිමාධිකරණ සංකීර්ණය විස්තීර්ණ ලෙස නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන වියදම් සෘජුව, ප්‍රදාන ආයතනය විසින් සිදු කරන අතර, 2023 වර්ෂය සඳහා 110-2-27-2001(13) යටතේ රු.මිලියන 350 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද, අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2023 වර්ෂයට අදාළව කිසිදු වියදමක් දරා නොතිබුණි. එසේ වුව ද, ඉතිරිවීමට හේතු ලෙස "වියදම් වාර්තා ලබාගැනීමේ දුෂ්කරතා මත මෙම වැය විෂයය යටතේ වියදම් වාර්තා කිරීමට නොහැකි වී ඇත" ලෙස දක්වා තිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාළව ප්‍රදාන ආයතනය මඟින් සෘජු වියදම් දරන අතර එම වියදම් වාර්තා ලබා ගැනීමේ දුෂ්කරතා මත මෙම වැය විෂයය යටතේ වියදම් වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකි බව දන්වා තිබුණි. | වියදම් වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතු ය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) සඳහා එක් නිලධාරියෙක් ද, භාෂා පරිවර්තන එක් නිලධාරියෙක් ද, රියදුරු තනතුරක එක් නිලධාරියෙක් ද, කාර්යාල සේවක සේවයේ නිලධාරීන් 04 දෙනෙකු ද, ඇතුළුව නිලධාරීන් 07ක අතිරික්තයක් පැවතුණි. | සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) නිලධාරීන් අතරින් එක් නිලධාරියෙකු මේ වනවිට I ශ්‍රේණියට උසස්වීමට සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති අතර රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2023 හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ 2024 මාර්තු 21 දිනැති ලිපිය අනුව පූර්ණ කාලීනව I ශ්‍රේණියේ තනතුරුවල වැඩ බැලීම සඳහා පත්වීමට | අතිරික්ත තනතුරු සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබාගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | ඉල්ලීම්කර ඇති අතර, එය නිර්දේශකර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. අතිරික්ත භාෂා පරිවර්තක නිලධාරිනිය වයස අවුරුදු 55 සම්පූර්ණ වීම මත 2024 දෙසැම්බර් 31 දින සිට විශ්‍රාම ගැනීමට නියමිත ය. තව ද අතිරික්තව පැවති රියදුරු ද කාර්යාල කාර්ය සේවයේ නිලධාරීන් 3 දෙනෙකු ද මේ වන විට ස්ථාන මාරු වී ඇති අතර ඉතිරිව ඇති අතිරික්ත නිලධාරී හට ද ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ස්ථාන මාරු ලැබී ඇති බව දන්වා තිබුණි. | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලෙස වුව ද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක් සඳහා 2022 අප්‍රේල් 21 දින සිට වැඩ බැලීමේ පත්වීම් ලබාදී තිබූ අතර, තවත් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් සඳහා 2023 සිට වැඩ බැලීමේ පත්වීම ලබාදී තිබුණි. තෘතියික මට්ටමේ එක් තනතුරක් සඳහා 2023 පෙබරවාරි 06 දින සිට වැඩ බැලීමේ පත්වීමක් ලබාදී තිබුණි. | එම තනතුරුවලට අදාළ පත්වීම් බලධාරියා වන රාජ්‍ය පරිපාලන ලේකම් වෙතින් තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ඉල්ලීම් කළ ද පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් එම වැඩ බැලීමේ පත්වීම් සිදුකර ඇත. මේ වනවිට එම ජ්‍යේෂ්ඨ මට්ටමේ තනතුරු අතුරින් එක් තනතුරු පුරප්පාඩුවක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා අංක 02/2022 දරන චක්‍රලේඛය අනුව ස්ථිර පදනමින් නිලධාරියෙකු පත්කර ඇති අතර, සෙසු වැඩ බැලීමේ පත්කිරීම් ද සිදුකර ඇත්තේ ද එම චක්‍රලේඛය අනුව බව දන්වා තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු ය. |
| (ඇ) | අධීක්ෂණ සමථ මණ්ඩල පුහුණු නිලධාරින් 02 ක් වසර 8 කට අධික කාලයක සිට පුරප්පාඩුව පැවතිය ද, පුරප්පාඩු පිරවීමට කටයුතුකර නොතිබුණි. | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2024 ජනවාරි 01 දිනැති ලිපියෙන් බඳවාගැනීම් සිදුකිරීමට අනුමැතිය ලබාදී ඇති අතර, ඒ අනුව ඉදිරියේදී බඳවාගැනීමේ කටයුතු සිදු කිරීමට නියමිත බව දන්වා තිබුණි. | පුරප්පාඩු තනතුර සඳහා බඳවාගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඈ) | සමථ මණ්ඩල කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය වූ 441 න් තනතුරු 72 ක පුරප්පාඩු පවතින අතර, ඉන් සියයට 50 ක් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට සෘජුව දායක වන තනතුරු වේ. | කාර්යය මණ්ඩල පුරප්පාඩු 72 න් 50 ක් සමථ පුහුණු නිලධාරී තනතුරු වන අතර, එයින් දැනට පුරප්පාඩු 30 ක් පවතී. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/2014 හා 1279 ජුනි 17 දිනැති ලිපිය අනුව කාර්යය මණ්ඩල සමාලෝචනයේදී සමථ පුහුණු නිලධාරී තනතුරු 50 ක් අනුමතකර තිබුණ ද තනතුරු 30 ක් ප්‍රමාණවත් බව හඳුනාගැනීමෙන් අනතුරුව තනතුරු 20 | පුරප්පාඩු පවතින තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | ක් යටපත් කිරීමට කටයුතුකර ඇත. එම තනතුරු 30 ට අදාළ පවතින පුරප්පාඩු සංඛ්‍යාව 10 ක් වන අතර, ඉදිරියේදි සමථ පුහුණු නිලධාරින් බඳවාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව දන්වා තිබුණි. | |
| (ඉ) | අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් නොවූ රියදුරු තනතුරක් සඳහා 2023 වර්ෂය තුළ එකතුව රු.332,132 ක මුදලක් වැටුප් සහ දීමනා ලෙස ගෙවා තිබුණි. මෙම තනතුර 2020 ජනවාරි 01 සිට පැවති අතර, විධිමත් පත්වීමක් නොමැතිව වැටුප් හා දීමනා ගෙවීම් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි. | 2019 වර්ෂයේ සිට පැවති මෙම රියදුරු තනතුර ස්ථිරකර ගැනීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් කළ ද ඒ සඳහා අනුමැතිය නොලැබුණි. කෙසේ නමුත්, මේ වන විට අමාත්‍යාංශයේ නිලරථ හිමිකම ඇති මාණ්ඩලික ගණයේ තනතුරු කිහිපයක පුරප්පාඩු සම්පූර්ණවීම මත එම නිලධාරීන්ට ද නිලරථ හා රියදුරන් අනුයුක්ත කිරීමට සිදු වූ බැවින් අනුමත රියදුරු තනතුරු සංඛ්‍යාව ඉක්මවා රියදුරන්ගේ අවශ්‍යතාවය පැන නැගීම මත රාජකාරී අවශ්‍යතාවය සලකා අමාත්‍යාංශ කාර්යය මණ්ඩලයට තාවකාලික රියදුරු තනතුරක් අනුමත කරගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කර ඇති බව දන්වා තිබුණි. | තනතුරු සඳහා කළමනාකරණ සේවා අනුමැතිය ලබාගත යුතු ය. |